# ශ්‍රී ලංකා පාසල් දැල්පන්දු කණ්ඩායම මෙවරත් මෙල්බන් නුවරට
# අපි අපේම දරුවන්ට අනුග්‍රහය දක්වමු....

නදී අබේරත්න
(ක්‍රීඩා සහ ශාරීරික උපදේශිකා ශ්‍රී ලංකා)



ශ්‍රී ලංකා පාසල් දැල් පන්දු කණ්ඩායම ජූනි 27 වනදා මෙල්බර්න් නුවරට පැමිණීමට නියමිතයි. ඔවුහු මෙල්බර්න් නුවර පාසල් සහ අනෙකුත් ක්‍රීඩා සමාජ නියෝජනය කරන දැල්පන්දු කණ්ඩායම් සමග තරග ගණනාවකට සහභාගි වීමට බලාපොරොත්තු වෙති.

ශ්‍රී ලංකා පාසල් දැල්පන්දු කණ්ඩායම පසුගිය වසර කිහිපය පුරාම මෙල්බර්න් නුවර වාර්ෂිකව පැවැත්වෙන මේ දැල්පන්දු තරගාවලියට සහභාගි වීමට පැමිණියහ. ඒ සෑම අවස්ථාවකම ඔවුන්ට අනුග්‍රාහකත්වය ලබා දුන්නේ මෙල්බර්න් නුවර සිංහල සංස්කෘතික සංගමයයි. නමුත් කුමක් හෝ හේතුවක් නිසාවෙන් මේ වසරේ දී, මෙල්බර්න් නුවර සිංහල සංස්කෘතික සංගමයේ සහයෝගය ක්‍රීඩා කණ්ඩායමට නොලැබී ගොස් ඇත. මේ සා කාලයක් එක දිගටම පාසල් දැල්පන්දු කණ්ඩායම මෙහි ගෙන ඒමට මූලික වී කටයුතු කළ සංස්කෘතික සංගමය මෙවර ඒ වගකීම බාර ගැනීමට ඉදිරිපත් නොවූයේ ඇයි දැයි අපි නොදනිමු. කෙසේ වුවද පසුගිය වසර කිහිපය පුරාම පාසල් දැල්පන්දු කණ්ඩායමට මෙල්බර්න් නුවරට පැමිණ තරග වලට සහභාගි වීමට පූර්ණ අනුග්‍රාහකත්වය ලබා දුන් සිංහල සංස්කෘතික සංගමයට අපගේ නොමඳ කෘතඥතාව පළ කළ යුතුය.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ජාතික පාසල් දැල් පන්දු කණ්ඩායමට මෙල්බර්න් නුවරට පැමිණ අන්තර්ජාතික තරගාවලියකට සහභාගි වීමට ලැබෙන මේ විරල අවස්ථාව මේ වසරේදී මග හැර යා නොදී රැක දීම මෙහි ජීවත් වන ශ්‍රී ලාංකික ප්‍රජාවගේ යුතුකම යැයි මම හඟිමි. ශ්‍රී ලංකා පාසල් දැල් පන්දු කණ්ඩායම නියෝජනය කිරීමට තෝරා ගැනෙන්නේ රටේ විවිධ පළාත්වල පාසල් දැල්පන්දු කණ්ඩායම්වල විශේෂ දක්ෂතා පෙන්නුම් කරන ක්‍රීඩිකාවන් අතුරෙන් තෝරා ගන්නා හොඳම ක්‍රීඩිකාවන්ගෙනි. ඒ අයගෙන් බොහෝ දෙනෙකු පුහුණුවීම් කටයුතු කරන්නේ ඉතාම දුෂ්කර තත්ත්වයන් යටතේයි. සාමාජිකාවන් රටේ විවිධ තැන්වල විසිරී සිටින බැවින්, මුළු දැල් පන්දු කණ්ඩායමටම කණ්ඩායමක් හැටියට එකට එක්ව පුහුණුවීම්වල නිරත වීමට ලැබෙන අවස්ථා ද ඉතා අඩුය.

මෙවැනි විදේශ සංචාරයකට සහභාගි වීමට සූදානම් වන විට, ඒ සඳහා පූර්ව පුහුණුවීම් කටයුතුවල යෙදෙන්නට ඉඩ ලැබෙන්නේ සතියක් වැනි කෙටි කාලයකි. ඕස්ට්‍රේලියාව වැනි පූර්ණ සංවර්ධිත රටක ඉතා ඉහළ තාක්ෂණික පහසුකම් යටතේ නිරන්තර පුහුණුවීම්වල නිරත වන ක්‍රීඩා කණ්ඩායම් සමග තරග වැදීම අපේ දැල් පන්දු කණ්ඩායමට අභියෝගයක්ය යන්න පිළිගැනීම එතරම් අපහසු නැත. ජයග්‍රහණ වාර්තා කිරීමට පසුගිය වසරවල අපේ කණ්ඩායමට නොහැකි වූවා නම් එයට හේතුව සම්පත් හිඟය සහ අඩු පහසුකම් මිස, ක්‍රීඩිකාවන්ගේ කැපවීමේවත්, දක්ෂතාවේවත් අඩුවක් නම් නොවන බව මා පවසන්නේ ඉතා විශ්වාසයෙනි. එසේ නම් අපේ රටින් එන කණ්ඩායමට සෑහෙන තරම් පූර්ව පුහුණුවීම්වල නිරත වීමටත්, නිසි කායික සහ මානසික සුවයෙන් සන්නද්ධව තරග බිමට පැමිණීමටත් අවශ්‍ය කරන මූලික පහසුකම් සපයා දීම අනුග්‍රාහකයන්ගේ වගකීමකි.

මේ තරග පැවැත්වෙන්නේ මෙල්බර්න් නුවර සීතල සෘතුවේ දින වල බැවින් නුපුරුදු දේශගුණික තත්ත්වයද අපේ ක්‍රීඩිකාවන්ට අමතර අභියෝගයක් වන බව අප අමතක නොකළ යුතුය. එහෙයින් මේ දුෂ්කරතාවන් ජයගැනීමට අවශ්‍ය සහයෝගය අප ලබා දුනහොත්, මේ දැරියන් ඉතා හොඳ තරගයක් ලබා දෙමින්, ශ්‍රී ලංකාවට කීර්තියක් අත් කර දෙමින් මෙල්බර්න් නුවර ක්‍රීඩා පිටියේ දස්කම් දක්වනු ඇති බවට මට නම් කිසිදු සැකයක් නැත. අපේ ක්‍රීඩිකාවන් තුළ ඒ සඳහා අවැසි අධිෂ්ඨානයත්, කැපවීමත් නොඅඩුව ඇති බව වසර ගණනාවක් පුරා පාසල් දැල් පන්දු ක්‍රීඩිකාවන් ඇසුරේ ගුරුවරියක ලෙස කටයුතු කළ මම අත්දැකීමෙන් දනිමි. අපේ වැනි රටක පාසල් ක්‍රීඩා කණ්ඩායමකට ඕස්ට්‍රේලියාව වැනි රටක ක්‍රීඩිකාවන් සමග තරගකරන්නට ලැබෙන අවස්ථාව ඉතා වැදගත් එකක් නොවන්නේද? එවැනි තරගයකට එක්ව ලබා ගන්නා අත්දැකීම්, අනාගත ජාත්‍යන්තර තරගවලදී වඩා හොඳින් දස්කම් පෑමට හේතු වන බව නොඅනුමානය.

මේ තරගයකට සහභාගි වීමට මෙහි එන්නට මේ දැරියන් සහ ඔවුන් කැටුව එන ගුරුවරියන් විශාල කැපවීමක් කරන බව ද අප අමතක නොකළ යුතුයි. ගුවන් ටිකට් පත් මිලදී ගන්නටත්, ගමනට අවශ්‍ය අනෙකුත් දේ සූදානම් කරගන්නටත් අවශ්‍ය බරපැණ සොයා ගැනීමට ඔවුහු මහත් වෙහෙසක් දරති. ඇතැම් දරුවන් සහ ගුරුවරියන් ඒ සඳහා තමන් සතු කණකර පවා උගසට තබන බව ඔවුන් සමග පසුගිය දිනවල කතා බහ කරද්දී මම දැනගතිමි. කුඩා දුවා දරුවන් සිටින ඇතැම් ගුරුවරියන්ට දින කිහිපයකට හෝ පවුලෙන් වෙන්වී විදේශ රටකට පැමිණීම පහසු දෙයක් නොවේ. කෙසේ හෝ මේ සියලු මූල්‍ය අපහසුතාත්, පෞද්ගලික වගකීමුත් මධ්‍යයේ ගුරුවරියන් සහ ක්‍රීඩිකාවන් මේ තරග වලට සහභාගි වීමට මෙහි පැමිණෙන්නේ ක්‍රීඩාව කෙරෙහි ඇති ඇල්ම සහ කැපවීමත්, අලුත් අත්දැකීම් ලබා තමන්ගේ හැකියාවන් මුවහත් කරගැනීමට ඇති උනන්දුවත් නිසාමය. අපට හැකි පමණින් ඔවුන්ට අනුග්‍රාහකත්වය ලබා දීම ඒ කැපවීම වෙනුවෙන් අපට පළ කළ හැකි ගෞරවයයි.

ක්‍රිකට් වැනි ක්‍රීඩාවකට ලැබෙන වාණිජ අනුග්‍රාහකත්වයක් ඒ සඳහා ක්‍රීඩා ලෝලීන්ගේ ඇති අති මහත් උනන්දුවත් හා සසඳන විට දැල් පන්දු වැනි ක්‍රීඩාවකට ලැබෙන සහයෝගය ඉතා අවමය. නමුත්, ක්‍රිකට් වලට ලැබෙන වටිනාකම නිර්මාණය වී ඇත්තේ මාධ්‍යය මගින් එය මහත් උත්කර්ෂයට නංවා ඇති බැවිනි. දැල්පන්දු කණ්ඩායම ලබන ජාත්‍යන්තර ජයත්, ක්‍රිකට් ක්‍රීඩාවෙන් ලබන ජාත්‍යන්තර ජයත් රටට අත්කර දෙන්නේ එකම කීර්තියක් නොවේද? මාධ්‍යය විසින් එතරම් උලුප්පා නොදක්වන, වෙළඳ අනුග්‍රාහකයන්ගේ න්‍යාය පත්‍රයට නිරායාසයෙන් ඇතුල් නොවන මෙවැනි ක්‍රීඩාවකට සහභාගි වීමට මහත් අඩු පාඩුකම් මැද්දේ මෙල්බර්න් නුවරට පැමිණෙන අපේ රටේ දියණිවරුන්ට අපට හැකි උපරිමයෙන් සහය පළ කිරීමට අප ඉදිරිපත් විය යුත්තේ එබැවිනි. ලෝකයේ කුඩා රටක් වන ලංකාව වැනි රටක පුරවැසියන් වන අපි විවිධ මාර්ග ඔස්සේ ඕස්ට්‍රේලියාව වැනි දියුණු රටක පහසුකම් යටතේ ජීවත් වීමට වාසනාව උදා කරගෙන සිටින්නෙමු. එවන් අප අපගේ උපන් රටේ තවමත් ඉතා අඩු පහසුකම් යටතේ ජීවත් වන අපේම දරු පිරිසකට ජාත්‍යන්තර අත්දැකීම් ලබා ගැනීමට අතහිත දීම යුතුකමක් සේම එය අපට සතුටට පත්වීමට හේතුවක්ද නොවන්නේද?

දුර කතර ගෙවාගෙන මෙල්බර්න් නුවරට පැමිණෙන අපේ ජාතික පාසල් දැල්පන්දු කණ්ඩායම සාදරයෙන් පිළිගැනිමට අපි සූදානම් වී සිටිමු. ඔවුන් පිළිගැනීම උදෙසා ජූනි 28 වනදා ආප්ප රාත්‍රියක් සංවිධානය කර තිබේ. නෝබල් පාක් හි ජෑන් විල්සන් ප්‍රජා ශාලාවේ සවස 7 සිට පැවැත්වෙන මේ සාදයට සහභාගි වී දැල්පන්දු කණ්ඩායමට ධෛර්යය ලබා දෙන මෙන් මෙල්බර්න් නුවර වසන ශ්‍රී ලාංකික හිතවතුන්ට කෘතඥතා පූර්වකව ඇරයුම් කර සිටිමු.

සන්නස වෙළඳ දැන්වීම් සඳහා විමසන්න / Advertising Enquiries
**S Jayasinghe** 03 8707 4604 / 0402 025 516
sannasanews@gmail.com

